# 12 අපේ උරුමය සුරකිමු

දෙවන පෑතිස් මහ රජතුමන් දවස මිහිඳු මාහිමියන් ඇතුළු ධර්මදූත පිරිස විසින් ලක්වැසියනට දායාද කොට දෙන ලද්දේ බුදුදහම, ඇදහිලි, විශ්වාස හා පුද සිරිත් මාර්ගයක් පමණක් ම නො වේ. එය මෙරට ජනයාගේ සිතුම් පැතුම්, ගති ගුණ, අභිරුචිය හා රසිකත්වය ද ඔවුන්ගේ ආචාර සමාචාර හා යහගුණ ද උසස් ලෙස ගොඩනැගීමෙහි සමත් ශ්‍රේෂ්ඨ ධර්ම මාර්ගයකි. ඒ අනුව මෙරට සංස්කෘතිය නොයෙක් අයුරින් පෝෂණය වූයේ ය. විශිෂ්ට සංස්කෘතික උරුම රැසක් ම අප සතු විය. ඉතිහාසය තුළ විවිධ සමාජ, ආර්ථික, සංස්කෘතික වෙනස්කම්වලට භාජන වුව ද මෙකී උරුමයෝ දෙදහස් පන්සිය වසරක් තිස්සේ තවමත් අපේ ජන ජීවිතය පෝෂණය කරති.

## බුදුදහම

මහින්දාගමනයට පෙර මෙරට පැවතියේ අසංවිධානාත්මක ප්‍රාථමික ආගමික විශ්වාස සමූහයකි. මිනිස් සිතුම් පැතුම් හරවත් කිරීම පිණිසත් මිනිස් ක්‍රියාකාරකම් ඵලදායක කිරීම පිණිසත් එම ආගමික විශ්වාසයන්ට ප්‍රබල හැකියාවක් නො තිබිණි. මිහිඳු මාහිමියෝ එම විශ්වාසවලට සෘජු ව පහර නුදුන්හ. ඒවා වඩාත් ඵලදායක වන පරිදි නව අර්ථ මතු කෙරෙමින් බෞද්ධ රටාව තුළට ම ඇතුළු කළහ. බුදුදහම අන්තගාමී දෘෂ්ටි මතවාදයක් නො වීමත්, නිදහස ගරු කළ මධ්‍යස්ථ විචාර පූර්වක දහමක් වීමත් නිසා එසේ සිදුවිය. එක් අතෙකින් මෙරට ජනයාට මෙලොව වශයෙන් සුඛිත මුදිත ජීවිත ගත කරන සාමයෙන් හා සතුටින් වසන ස්වයංපෝෂිත තත්ත්වයක් වෙත ළඟාවීමට අවශ්‍ය අනුබලය හා පෙළඹවීම මෙන් ම මාර්ගෝපදේශකත්වය ද බුදුදහම තුළ පැවතිණ. අනෙක් අතින් ඔවුනට කායික මානසික හා බුද්ධිමය වශයෙන් ඉහළ තලයකට ළඟා වීමට අවශ්‍ය ආදර්ශය හා උපදේශනය ද බුදු දහමෙහි තිබිණ. එසේ ම පුද්ගලයන් වශයෙන් මෙන් ම සමාජයක් වශයෙන් ද එසේ සංවර්ධනය වීම තුළින් ළඟා විය හැකි විමුක්තියක් ද බුදු දහමෙහි ඉගැන්විණ. මෙසේ දෙලොව ජය ගැන්මටත් විමුක්තිය උදාකර ගැන්මටත් ප්‍රායෝගික ව එසේ ම යථාර්ථවාදී ව මඟ පෙන්වන උතුම් වූ බුදුදහම ශ්‍රී ලාංකිකයන් වෙත දායාදවීම මහින්දාගමනයේ උසස් ම ප්‍රතිඵලය වූයේ ය. බුදු දහමෙහි මඟ පෙන්වීම අනුව ලක්වැසියෝ ද දෙවනපෑතිස් මහ

රජතුමන් මෙන් ම පසුකාලීන බොහෝ රජ දරුවෝ ද තෙරුවන් සරණ ගියෝ ය. ලෝකයේ අසමසම කරුණා ගුණයෙන් ද ප්‍රඥා මහිමයෙන් ද යුත් විශිෂ්ටතම ආචාර්යවරයා වූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇත්තෝ වූහ. උන් වහන්සේගේ මග පෙන්වීම ද උතුම් කොට සැලකුවෝ ය. ලෝකය, ජීවිතය හා සමාජය ද පිළිබඳ ඇති තතු හෙළි කරන අති උතුම් ධර්මය සරණ ගියෝ ය. ඒ කෙරෙහි ශ්‍රද්ධාව ඇත්තෝ වූහ. එහි ඇතුළත් සදුපදේශයන් උතුම් කොට සලකා ක්‍රියා කළෝ ය. ලෝකයේ වඩාත් ම පැරණි සමාජ මෙහෙවරට කැප වූ ස්වේච්ඡා සංවිධානය වූ ද සිය ශාස්තෘවරයාගේ දහම දිවි හිමියෙන් රකිමින් ඒ අනුව දිවි ගෙවමින් එයින් ප්‍රජාවට නිබඳ ව ම මග පෙන්වීමෙහි නිරත වූ ශ්‍රාවක සංඝ රත්නය සරණ ගියෝ ය. ඒ කෙරේ ශ්‍රද්ධාව ඇත්තෝ වූහ. සඟරුවනින් ලැබෙන අනුශාසනය තුළින් රට දැය ගොඩනැඟීම ම උතුම් කොට සැලකුවෝ ය. මෙසේ තෙරුවන් පිහිට හැර අන් පිහිටක් නොපැතීම පමණක් නො ව ඒ අනුව යමින් පස්පව්, දස අකුසල් ඇතුළු සියලු පහත් ක්‍රියා පිළිකුල් කරන ජන සමාජයක් බිහිවීම ද බුදු දහමින් ලද දායාදයකි. පරපණ නැසීම, පර හිංසාව, අශිෂ්ට ලිංගික සබඳතා පැවැත්වීම, බොරුකීම, අනුන් රැවටීම, මත්වතුර හා මත්ද්‍රව්‍ය භාවිතය, මදය ප්‍රමාදය පිළිකුල් කරන, සැකෙවින් කිවහොත් පන්සිල් ගරු කරන සමාජයක් ඇතිවිය. එසේ නො කළ යුත්ත නො කළ පැරණි ලක්වැසියෝ දාන, සීල, භාවනාදී වශයෙන් බුදු දහම ඉගැන්වූ පරිදි කළ යුත්ත කිරීමට ද පුරුදු වූහ. බෝධිසත්ත්ව ආදර්ශය අනුවත්, බුද්ධානුශාසනය අනුවත් ගිය ලාංකිකයන් පන්සිල්, අටසිල් රක්නා ශීලාචාර මිනිසුන් වූයේ ද මනසින් මත් නොවූ සමබර සංයත සිත් ඇත්තවුන් වූයේ ද මහින්දාගමනයේ ප්‍රතිඵල වශයෙනි. ඔවුන් මාපිය - දූදරු, ගුරු - ශිෂ්‍ය, ස්වාමි - භාර්යා, ස්වාමි - සේවක, ගිහි- පැවිදි හා මිත්‍ර සබඳතා ඇති ව එකිනෙකාට යුතුකම් ඉටු කිරීම තුළින් සහජීවන පිළිවෙත ඇති ව ඉතිහාසයේ දිගු කලක් තිස්සේ දියුණු ජාතියක් ලෙස වැජඹුණේ ද බුදු දහමින් ලද මග පෙන්වීමෙනි. සැකෙවින් කිවහොත් මහින්දාගමනය නිසා මෙරට ප්‍රජාව බුදුදහම තුළින් ලද පෝෂණය වෙනත් කිසිදු ආගමකින් ධර්ම ශාස්ත්‍රයකින් හෝ විද්‍යාවකින් ලැබී නැත.

## භික්ෂු - භික්ෂුණී සංවිධාන

මහින්දාගමනයෙන් පසු ව මෙරට පොදුජන සංස්කෘතිය හා සභ්‍යත්වය එලෙස පෝෂණය කිරීමෙහි ලා පුරෝගාමී වූයේ සිංහල භික්ෂු වංශය හා භික්ෂුණී සමාජයයි. මිහිඳු මාහිමියන්ගේ අනුශාසනයත් දෙවනපෑතිස් මහරජතුමාගේ

අනුග්‍රහයත් ඇති ව මහාඅරිට්ඨ කුමරු ඇතුළු පන්සියයක් දෙනා පැවිදි කිරීමෙන් මෙරට දේශීය භික්ෂු සමාජය ආරම්භ විය. උන්වහන්සේලාගේ පුරෝගාමීත්වයෙන් අනුක්‍රමයෙන් ගමින් ගම, නුවරින් නුවර වෙහෙර විහාර ඇති විය. විහාරස්ථානය ගමෙහි අධ්‍යාපන, සමාජ, සංස්කෘතික මධ්‍යස්ථානය වූවා පමණක් නො ව ආර්ථිකයෙහි ජීවය වූ ගොවි ජනතාව සංවිධානය කළ ආයතනය ද විය. රජුන්ට, රාජකාරියෙහි යෙදුනවුන්ට මෙන් ම ගොවි ජනතාව ප්‍රධාන සියලු රටවැසියන්ට ද මෙලොව පරලොව ජයගැන්මට නිස්සරණාධ්‍යාසයෙන් අනුශාසනා කරන ලද්දේ භික්ෂූන් වහන්සේලා විසිනි. රජුන්, ඇමතියන් ප්‍රධාන ගිහි බෞද්ධයෝ උන්වහන්සේලාට සිවුපසයෙන් සංග්‍රහ කිරීම තම යුතුකම සේ පිළිගත්හ. එය ඉතා ඉහළින් ම ඉටු කරන ලදී. අපේ ඉතිහාසය තුළ බිහි වූ උගත් එසේ ම සිල්වත් භික්ෂු පරපුර නිසා වෙසෙසින් ම අපට ම ආවේණික වූ බෞද්ධ පදනමක් ඇති දේශීය අධ්‍යාපන ක්‍රමයක් ඇති වූ අතර අනුක්‍රමයෙන් එය අතුපතර විහිද පුළුල් වීමෙන් විශිෂ්ට උගත්තු ද බිහි වූහ. සිංහල, පාලි, සංස්කෘත, බුද්ධ ධර්මය, ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය, ව්‍යාකරණ, ඡන්දස් අලංකාර, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂය ආදි විෂයයන් මෙන් ම කලා ශිල්පය, වාරි ශිල්පය, ලෝකුරු කර්මාන්තය ආදි විෂයයන් ද ආරාමික අධ්‍යාපන ආයතන තුළ ගිහි පැවිදි සිසුන්ට අදාළ පරිදි ප්‍රගුණ කරවූ බවට සාධක තිබේ. අනුරාධපුර මහාවිහාරය, අභයගිරිය, ජේතවනය, රුහුණෙහි තිස්සමහා විහාරය ආදී වඩාත් ප්‍රකට බෞද්ධ ආයතන මෙම අධ්‍යාපන සමාජ සංස්කෘතික මෙහෙවරෙහි මූලිකත්වය දරා ඇති බව ද පෙනේ. දේශීය භික්ෂුණී සමාජය ආරම්භ වන්නේ සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ සම්ප්‍රාප්තියත් සමඟ ය. අපේ ඓතිහාසික මූලාශ්‍රය අනුව පැවිදි වීමට කැමති වූ ලක්දිව කාන්තාවන් පැවිදි කිරීමෙන් ඔවුන්ට විමුක්ති මාර්ගය පෙන්වා දීමට මුල් වූයේ ද දෙවනපෑතිස් මහරජතුමන් හා මිහිඳු මාහිමියන් ය. උන්වහන්සේගේ සොහොයුරියක වන සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ මෙරටට වැඩම කළේ ද එම දෙදෙනා වහන්සේගේ ම පියාණන් වූ දඹදිව ධර්මාශෝක මහාධිරාජයාගේ අනුග්‍රහයෙනි. මිහිඳු මාහිමියන්ගේ උපදෙස් පරිදි දෙවනපෑතිස් රජතුමන් විසින් දඹදිවට යවන ලද දූතයන් මගින් කළ ඉල්ලීම අනුව ධර්මාශෝක මහාධිරාජයා විසින් බුදුරදුන්ට බුදුබව පිණිස සෙවණ දුන් ජය ශ්‍රී මහා බෝධි වෘක්ෂයේ දක්ෂිණ ශාඛාව ද සමඟ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ මෙහි වැඩම කළ බව සඳහන් ය. එතුමියගේ මූලිකත්වයෙන් අනුලා දේවිය ප්‍රධාන කාන්තාවන් පැවිදි කරන ලද අතර ඉන් ඇරඹුණු මෙරට භික්ෂුණී සමාජය ද දිගු කලක් තිස්සේ මෙරට කාන්තාවන් ඇතුළු සමස්ත සමාජයට ම විමුක්ති මාර්ගය පෙන්වා දුන් බව ඉතිහාසගත වාර්තාවලින් පෙනේ.

## කලා ශිල්ප

සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ විසින් ශ්‍රී මහා බෝධි ශාඛාව මෙරටට වැඩමවද්දී ධර්මාශෝක අධිරාජයාණන්ගේ ද අනුග්‍රහය ඇතිව අටලොස් ගණයක කලා ශිල්පීහු ද පැමිණියෝ ය. භික්ෂූන් වහන්සේලාගේ අනුශාසනය ද රජුන්ගේ, ඇමතියන්ගේ හා විවිධ ප්‍රභූවරුන්ගේ අනුග්‍රහය ද ඇති ව මෙරට වෙහෙර විහාර තුළ අතිවිශිෂ්ට වූ දැකුම්කලු කලා නිර්මාණ බිහිවීමට මුල පිරුවේ එම ශිල්පීන්ගේ පැමිණීමයි. අනුරාධපුරය, මිහින්තලය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, මහනුවර ආදී මෙරට ඓතිහාසික නගරවල මෙන් ම තවත් බොහෝ ගම් නියම්ගම් හා නගරවල ද විහාරස්ථාන ආශ්‍රිත ව විවිධ විශිෂ්ට කලා නිර්මාණ දක්නට ලැබෙයි. සුවිසල් මහ දාගැබ්, බුදු පිළිම හා බෝසත් පිළිම වෙනත් මූර්ති, චිත්‍ර, කැටයම්, අලංකාර ගෘහ නිර්මාණ ආදියෙන් ලක්දිව පූජනීයත්වයටත්, කීර්තියටත් පත්වූයේ මහින්දාගමනයේ ප්‍රතිඵල වශයෙනි. වඩාත් පැරණි යැයි පිළිගන්නා මහියංගන, ථූපාරාම දාගැබ් ද රුවන්වැලි මහ සෑය, අභයගිරි ස්තූපය ඇතුළු රට පුරා නොයෙක් තැන ඉදි වූ දාගැබ් ද මෙරට ජනතාවගේ ආගමික හැදියාවත්, නිර්මාණ ශක්තියත්, පුළුල් ශිල්පීය හැකියාවත් ප්‍රකට කරයි. අනුරාධපුර මහමෙවුනාවේ සමාධි බුදු පිළිම වහන්සේ ද අවුකන, තොළුවිල, මාළිගාවිල හා පොළොන්නරුව ඇතුළු ලක්දිව දසදෙස ඉදිවී ඇති ඉපැරණි ශෛලමය හා දාරුමය බුදු පිළිම වහන්සේලා ද එලෙසින් ම අපට දායාද විය. දැනට ශේෂ ව ඇති වෙනත් මූර්ති ද රාශියකි. මාළිගාවිල, කුෂ්ටරාජගල වැනි ස්ථානවල දක්නට ලැබෙන බෝධිසත්ව රූප මින් මුල් තැනක් ගනී.

බුදු සිරිත, බෞද්ධ සාහිත්‍යය, ශාසන ඉතිහාසය තේමා කොට ගත් අතිශයින් සිත් ගන්නා සුලු නිර්මාණාත්මක චිත්‍ර සමූහයක් ද මෙරට පැරණි ලෙන් විහාරවල හා වෙනත් ගොඩනැගිලිවල ශේෂ ව පවතියි. දඹුල්ල ලෙන් විහාරය, කැලණි රජමහා විහාරය වැනි ස්ථානවල සුරැකී ඇති එබඳු චිත්‍ර වඩාත් ප්‍රකට ය. එම චිත්‍ර තුළින් හෙළ කලාකරුවන්ගේ අපූර්ව නිර්මාණ කුසලතාව, ධර්මාවබෝධය, ආගමික ශ්‍රද්ධාව මෙන් ම ශිල්පීය නිපුණතාව ද මැනවින් ප්‍රදර්ශනය වේ. මෙලෙසින් ම උසස් කැටයම් කලාවක් අපට උරුම වූයේ ද මහින්දාගමනයෙන් පසුවයි. විවිධ ගල් කැටයම් මෙන් ම ලී කැටයම් ද ඉතා සියුම් ලෙසත් දැකුම්කලු ලෙසත් මෙරට ශිල්පීහු නිර්මාණය කළහ.

## බෞද්ධ සාහිත්‍යය

මහින්දාගමනයෙන් පසු ලක්දිව භාෂා සාහිත්‍යය ද බුදු දහමින් නොමඳ පෝෂණයක් ලැබුවේ ය. භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ගිහි විද්වතුන්ගේ ද විශිෂ්ට ප්‍රයත්නය තුළින් විශාල වශයෙන් දියුණුවට පත් වූයේ ය. භාරතීය බ්‍රාහ්මී අක්ෂරවල ද ආභාසය ඇති ව සිංහල අක්ෂර මාලාව සකස්වීම මහින්දාගමනයෙන් නොබෝ කලකින් ම සිදු වූ අතර එතැන් පටන් යුගයෙන් යුගය සාහිත්‍යමය අගයෙන් ද, පිරිපුන් ව ප්‍රජාවට විවිධ සදුපදේශ දීමෙහි ද සමත් ගද්‍ය පද්‍ය ග්‍රන්ථ රාශියක් බිහිවී තිබේ. එසේ ම ඉතිහාසය, ව්‍යාකරණ ශාස්ත්‍රය ආදි විෂයයන්ට අදාළ ව ද ඉතා වටිනා ග්‍රන්ථ සම්පාදනය විය. සියබස්ලකර, දම්පියා අටුවා ගැටපදය, සිඛවළද හා සිඛවළද විනිස, බුත්සරණ, දහම් සරණ, සඟ සරණ, ධර්මප්‍රදීපිකාව, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, පූජාවලිය ආදි ගද්‍ය ග්‍රන්ථ දනුදු සුරක්ෂිත ව තිබේ. මුවදෙව්දාව, සසදාව, ගුත්තිලය, බුදුගුණාලංකාරය, කව්සිළුමිණ, කාව්‍යශේඛරය හා සන්දේශ කාව්‍ය රාශියක් ද බෞද්ධ මූලාශ්‍ර ඇසුරින් රචිත තවත් ග්‍රන්ථ රාශියක් ද ලක්වැසියන් සතු ව ඇත. මහින්දාගමනයේ දායාද වශයෙන් බිහි වූ නොයෙක් අයුරින් වැඩි දියුණුවට පත් වූ මෙකී සිංහල සාහිත්‍යය ග්‍රන්ථ හැරුණු විට පූජාර්හ වස්තුන්ගේ හා පූජනීය ස්ථානවල ඉතිහාසය වාර්තා කොට ඇති වංශ කතා රැස ද භාෂා සාහිත්‍යය පෝෂණය කළ සිදත් සඟරාව වැනි ව්‍යාකරණ ග්‍රන්ථ ද මෙහි දී සඳහන් කළ යුතු ය. බුදු දහම නිසා මෙරටට දායාද වූ පාලි සංස්කෘත භාෂා සාහිත්‍යය ද සුරක්ෂිත කොට පෝෂණය කරන ලද්දේ ලක්වැසි ගිහි පැවිදි උගතුන් විසිනි. ඒ අනුව පාලි සාහිත්‍ය කෘති විශාල ප්‍රමාණයක් ද ත්‍රිපිටකය හා අටුවා ටීකාදිය ද බිහි විය. මෙරට ආයුර්වේදය, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂය, මහායාන බුදුදහම වැනි විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ව සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසක් ද දක්නට ලැබෙයි.



මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයෙන් අපට ලැබුණු උතුම් ම දායාදය බුදුදහමයි. එය හුදෙක් ඇදහිලි විශ්වාස හා පුද සිරිත් මාලාවක් නො වේ. ජීවන පිළිවෙතකි. එසේ ම ජන සමාජය හැම අතින් ම ශිෂ්ට සම්පන්න කිරීමටත්, එම ජන සමාජයට නොයෙක් අයුරින් ඵලදායක වූ සංස්කෘතිකාංග දායාද

කිරීමටත් සමත් ධර්ම මාර්ගයකි. එබැවින් මෙරට සමාජය සාරධර්මවලින් පෝෂණය කිරීමට මෙන් ම භික්ෂු - භික්ෂුණී සංවිධානවල පුරෝගාමීත්වය ද ඇති ව අධ්‍යාපනය, භාෂා සාහිත්‍යය, කලා ශිල්පාදි විවිධ ක්ෂේත්‍රයන් ඉහළ ම තැනට වැඩි දියුණු කර දීමට ද මහින්දාගමනයේ උතුම් දායාදය වූ බුදුදහම උපකාරී වූයේ ය. එබැවින් ම එම දායාදයන්ට ගරු කිරීමටත් ඒවා රැකගැනීමත් ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ පරම යුතුකමකි.

**සාරාංශය**

බුදුදහම මහින්දාගමනය තුළින් අපට ලැබුණ අති උතුම් ම දායාදයයි. එයින් පෝෂණය වූ අපේ සංස්කෘතිය ද ජාතියට උතුම් දායාද රැසක් තිළිණ කළේ ය. සමාජයට මහා මෙහෙවරක් කළ භික්ෂු - භික්ෂුණී සංවිධාන, ලොව මවිත කළ ශ්‍රේෂ්ඨ කලා ශිල්ප සමූහය හා රස භර පිරි ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කෘති ඉන් සමහරකි. මේ සියල්ල ඇසුරින් සැදැහැ සිතින් තෙරුවන් පුදන, උසස් සාරධර්මයෙන් සපිරි සමෘද්ධිමත් දැහැමි සමාජයක් ඇති විය. එබැවින් ඒ සඳහා මහෝපකාරී වූ ඒ ජාතික උරුමයන් රැක ගැන්ම අප සැමගේ පරම යුතුකමයි.

**ක්‍රියාකාරකම**

1. බුදු දහම ඇසුරින් මෙරට ජන ජීවිතයට එක් ව ඇති සාරධර්ම පහක් නම් වශයෙන් හඳුන්වා දෙන්න.
2. මෙරට අධ්‍යාපනයෙහි වැඩි දියුණුවට භික්ෂූන් වහන්සේගේ දායකත්වය පැහැදිලි වන කරුණු තුනක් ලියන්න.
3. ශ්‍රී ලංකාවේ සිතියමක් ගෙන ඓතිහාසික විහාරස්ථාන තුනක් පිහිටි තැන් ලකුණු කරන්න.
4. ජාතක කථා කවියෙන් ලියැවී ඇති සිංහල සාහිත්‍යය ග්‍රන්ථ 4ක් හා ඒවායේ කතුවරුන් ද නම් කරන්න.

**පැවරුම**

අපේ ජාතික උරුමයන් දැක බලා ගැනීම සඳහා අනුරාධපුරයට හා පොළොන්නරුවට යැම පිණිස අධ්‍යාපන චාරිකාවක් පිළියෙල කරන්න.